# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 6,977 — 1918ක්වූ නොවැම්බර් මස 14වෙනි දිනවූ බෘහස්පතින්ද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 3,195, S. P.**—දකුණු දිසාවේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 6වෙනි දිනවූ බෘහස්පතින්ද පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාලු පලාතේ ගඟබඩපත්තුවේ කොඩාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

සිතියම 9,822. ගම—පාතවැලිවිටිය. අයිතිකමකියන්නා—රජසන්තක.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 3613 | තිඹුලාහිටියකුඹුරේදූව .. | දොඩන්දූවේ පදිංචි ආර්. බී. ගුණතිලක | .. හේන .. | 0 | 0 | 32 | 30 |
| | | සිතියම 9,953. | | | | | |
| 4039 | ඇලටඹුවිලකරතුර .. | පාතවැලිවිටියේ පදිංචි මාකාවිටගමගේ ජොහානිස් | කුරුඳු තිබෙන .. | 0 | 0 | 35 | 35 |
| | | | වැව්ල්ල .. | — | | | 1 |
| | | සිතියම 10,775. ගම—ඌරල. | | | | | |
| 1 | කැකුලන්දෙනියේ ඔකඳ නොහොත් කොවේ ගොඩකන්ද .. | ඌරල පදිංචි ඇඩ්වින් විරගුනරත්න සහබන්දු .. | බැද්ද .. | 1 | 0 | 15 | 52.50 |
| 2 | එම .. | — .. | බැද්ද (විකුණනු නොලැබේ) .. | 0 | 1 | 11 | —* |
| | | සිතියම 10,828. ගම—ඇත්කඳුර. | | | | | |
| 1 | පිඹුරකහත්තේකැලේ.. | සෙම්බුකුට්ටිගේ පුන්චිහාමි .. | .. හුළු බැද්ද .. | 0 | 3 | 37·1 | 55† |
| | | සිතියම 10,837. අයිතිකමකියන්නා—ඇත්කඳුරේ පදිංචි ජී. ඩබ්ලිව්. ඔද්‍රිස් ද සිල්වා. | | | | | |
| 2 | වතුරවේ දෙනිය නොහොත් කොලවේගොඩ දෙනිය .. | ඇත්කඳුරේ පදින්චි කේ. ඇම්. ජී. ඒබ්‍රහාම් ගුණසේකර .. | .. වත්ත .. | 0 | 3 | 20 | 50 |
| | | | වැව්ල්ල .. | — | | | 31.50 |
| 3 | එම .. | එම .. | .. වත්ත .. | 0 | 0 | 32 | 50 |
| | | | වැව්ල්ල .. | — | | | 6.50 |
| | | සිතියම 10,875. ගම—දිව්තුරේ. අයිතිකමකියන්නා—රජසන්තක. | | | | | |
| 1 | කහටගහහේන නොහොත් බෝකුරු කැටූගොඩ කන්ද .. | කැරදේවල පදිංචි කේ. ඇම්. ජී. දොන් ලූවිස් .. | බැද්ද .. | 1 | 0 | 1 | 60 |
| | | සිතියම 10,816. ගම—ඌරල. | | | | | |
| 5 | අළුත් කුඹුරේ අද්දර දෙනිය .. | බද්දේගම පදිංචි ටී. ඒ. අබේවික්‍රම .. | එලවළු වත්ත .. | 0 | 2 | 0 | 95 |
| | | | වැව්ල්ල .. | — | | | 2.40 |

* තහනම් ඉඩම. † මිනිරන් හෑරීමේ බලය ඇතුව අක්කරයක් රුපියල් 150යි.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ මහලේකම්ප්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්ප්‍රතාරිස් වෙනුව.

S 1

**No. 3,196, S. P.**—දකුණු දිසාවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් විකිණීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 20වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බදුකරදෙන්ට නොයෙක් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. දකුණු දිසාවේ ගාළු පලාතේ බෙන්තොට වල්ලාවිටිකෝරළේ කොට්ඨාශයේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

සිතියම 10,895. ගම—මාගල උතුර අයිතිකම්කියන්නා—රාජසන්තක.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | පොල්හුන්නාකැලේ | ඇස්. ඩබ්ලිව්. හෙන්ද්‍රික් | බැද්ද | 1 2 29 | 62* |
| 2 | එම | — | බැද්ද (විකුණන්නේ නැහැ) | 0 0 24 | —† |
| | | සිතියම 10,926. ගම—යටගල. | | | |
| 1 | හල්ගහවෙලමානාන | පී. ඇම්. අබේසේකර විදාන ආරච්චි කොන්ගොඩ | පතන | 0 2 28 | 250‡ |
| 2 | එම | — | අඹිපාර සහ පතන (විකුණන්නේ නැහැ) | 0 1 20 | —† |
| 3 | එම | පී. ඇම් අබේසේකර විදාන ආරච්චි කොන්ගොඩ | පතන | 1 1 11 | 250‡ |
| | | සිතියම 10,945 ගම—ගල්තුඩුව. | | | |
| 1 | එළුවලගෙබැල්ල නොහොත් පලු වලමානාන | එච්. අච්නේරිස් ද සොයිසා | බැද්ද | 0 3 38 | 100* |
| 2 | එම | — | පතන (විකුණන්නේ නැහැ) | 0 0 26 | —† |
| 3 | එළුවලගොඩැල්ල නොහොත් විතුරවලගොඩකැලේ | ආර්. ඩී. ජේ. කරුණාරත්න පිස්කල්ආරච්චි | පතන | 1 0 10 | 100* |
| 4 | එම | — | එම | 0 1 24 | 100* |
| | | ගම—විතුරවෙල් පලාන. | | | |
| 5 | එළුවලගොඩැල්ල | ඩී. ඇන්. පී. විජේසේකර | එම | 0 3 35 | 100* |
| 6 | එම | — | පතන (විකුණන්නේ නැහැ) | 0 0 13 | —† |
| | | සිතියම 10,971. ගම—බටුකනත්ත. | | | |
| 1 | කැටකාලගහලන්ද | ඇම්. ඒ. පී. ද සිල්වා | හුළු බැද්ද | 0 3 28 | 65 |
| 2 | එම | — | එම (විකුණන්නේ නැහැ) | 0 0 14 | —† |

* මිනිරන් හැරීමේ බලය ඇතුව රුපියල් 300. † තහනම් ඉඩම්. ‡ මිනිරන් හැරීමේ බලය ඇතුව.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද, ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්, මහලේකම්තාරීස් වම්හ.

---

දකුණු පලාතේ මහජ්ජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1919ක්වූ ජනවාරි මස 15වෙනි දින හෝ ඊට මත්තෙන් ගාල්ලේ කච්චේරියේදී පොල්, රබර්, තේ හෝ වෙනත් වැවීම පිණිස මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම්කැබලි වර්ෂ 1919ක්වූ අප්‍රේල් මස 25වෙනි දින පටන් කාලසීමාවක් නොමැතිව බදුගැනීමට ඉල්ලා ලියා එවනලද ඉල්ලුම්පත්‍ර භාරගැනීමට බලාපොරොත්තුව සිටින්නේය. ඉල්ලුම්කරන අයවලුන්ගේ සම්පූර්ණ නම් සහ පදිංචියද සඳහන් නොකළ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද මහජ්ජන්ත උන්නාන්සේ වෙත අක්කරයකට හෝ ඉන් කොටසකට එක් එක බිම්කැබෙල්ලට නියමකර තිබෙන ප්‍රකාර මුදලක් තැන්පත්කොට තැබියයුතුවේ. එසේ මුදල් තැන්පත් නොකරන්නේනම් එකී ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණන්ට පෙර හෝ ඉඩමේ බද්ද විකිණීම නොකරණවායයි මහජ්ජන්ත උන්නාන්සේ විසින් නිශ්චයකරගන්නාතුරු ඉහතකී අන්දමින් තැන්පත්කරණලද මුදල් ආපසු ගෙවනු නොලැබේ. ආණ්ඩුවට අයිති ඉඩම් බදුදෙන ආඥාපණත යටතේ එකී වගන්තිවලට අනුව වර්ෂ 1919ක්වූ මාර්තු මස 25වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1ට ගාල්ලේ කච්චේරියේදී බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත. බද්ද වෙන්දේසියේදී ඉල්ලුම්කරන්ට පුළුවන් වනනේ ඉහතකී ප්‍රකාරයට මුදල් බැඳ ඉල්ලුම්කරපු අයවලුන්ට පමණකි.

බද්දේ කොන්දේසි ආදිය ගාල්ලේ මහජ්ජන්ත උන්නාන්සේගෙන් දැනගන්ට පුළුවන.

දකුණු දිසාවේ ගාලූ දිස්ත්‍රික්කේ බෙන්තොට වල්ලාවිටිකෝරළේ මෙහි පහත සඳහන් ගම්වල පිහිටි ඉඩම් කැබැලි 7ක්.

සිතියම 10,862. පිහිටි ස්ථානය—යටගල. විස්තරය—බැද්ද.

| අංක. | ඉඩමේ නම. | බිම්තරම අ. රූ. ප. | අක්කරයකට මූල් අවු රුදු හයේ එක එක අවුරුද්දට බද්ද. රු. ශ. | අක්කරයකට ඉතුරු අවුරුදු 24රේ එක එක අවුරුද්දට බද්ද. රු. ශ. | අක්කරයකට නොහොත් ඉන් කොටසකට මැනීමේ ගාස්තුව. රු. | අක්කරයක තක්සේරු මිල, රු. ශ. |
|---|---|---|---|---|---|---|
| 1 | දික්කැලේ | 2 3 20 | 1 70 | 5 95 | 4 | 9 50 |
| 2 | එම | 1 0 32 | 1 70 | 5 95 | 5 | 10 50 |
| 3 | එම | 0 3 18 | (තහනම් ඉඩම, බදුදෙනු නොලැබේ.) | | | |
| 4 | එම | 5 1 21 | 1 70 | 5 95 | 4 | 9 50 |
| 5 | එම | 0 2 12 | (තහනම් ඉඩම, බදුදෙනු නොලැබේ.) | | | |
| 6 | එම | 4 2 13 | 1 70 | 5 95 | 4 | 9 50 |
| 7 | එම | 1 2 10 | 1 70 | 5 95 | 4 | 9 50 |
| 8 | එම | 1 0 28 | (නොම්මර 7තේ කැබැල්ලත් සමග බදුදෙනු ලැබේ.) | | | |
| 9 | දික්කැලේ නොහොත් දික්කැලේඅද්දර ලවල | 1 1 10 | (නොම්මර 7තේ කැබැල්ලත් සමග බදුදෙනු ලැබේ.) | | | |
| | | | විස්තරය—පතන. | | | |
| 10 | දික්කැලේමානාන | 0 1 12 | (තහනම් ඉඩම, බදුදෙනු නොලැබේ.) | | | |
| | | | විස්තරය—දෙනිය. | | | |
| 18 | පරපාවතුරේදෙනිය | 0 1 34 | (තහනම් ඉඩම, බදුදෙනු නොලැබේ.) | | | |

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 7වෙනි දින කොළඹ මහලේකම්තාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්, මහලේකම්තාරීස් වම්හ.

---

දකුණු පලාතේ මහා ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 10වෙනි දිනට හෝ ඊට මත්තෙන් ගාල්ලේ කච්චේරියේදී පොල්, රබර්, තේ හෝ වෙනත් වැවීම පිණිස මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම් කැබලි වර්ෂ 1919ක්වූ මාර්තු මස 25වෙනි දින පටන් කාලසීමාවක් නොමැතිව බදු ගැණීමට ඉල්ලා ලියා එවනලද ඉල්ලුම්පත්‍ර භාර ගැනීමට බලාපොරොත්තුව සිටින්නේය. ඉල්ලුම්කරන අයවලුන්ගේ සම්පූර්ණ නම් සහ පදිංචියද සඳහන් නොකළ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ. තවද මහා ඒජන්ත උන්නාන්සේ වෙත අක්කරයකට හෝ ඉන් කොටස්කට එක එක බිම් කැබැල්ලට නියමකර තිබෙන ප්‍රකාර මුදලක් තැන්පත්කොට තැබිය යුතුයි. එසේ මුදලක් තැන්පත් නොකරන්නේනම් එකී ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණන්ට පෙර හෝ ඉඩමේ බද්ද විකිණීම නොකරනවායයි මහා ඒජන්ත උන්නාන්සේ විසින් නිශ්චයකරගන්නාතුරු ඉහතකී අන්දමින් තැන්පත්කරණලද මුදල් ආපසු ගෙවනු නොලැබේ.

ආණ්ඩුවට අයිති ඉඩම් බදුදෙන ආඥාපණත යටතේ එකී වගන්තිවලට අනුව වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 25වෙනි දිනවූ අඟහරුවාදා දවල් 1ට ගාල්ලේ කච්චේරියේදී බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත. බද්ද වෙන්දේසියේදී ඉල්ලුම්කරන්ට පුළුවන් වෙන්නේ ඉහතකී ප්‍රකාරයට මුදල් බැඳ ඉල්ලුම්කරපු අයවලුන්ට පමණකි.

බද්දේ කොන්දේසි ආදිය ගාල්ලේ මහා ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගන්ට පුළුවන.

දකුණු දිසාවේ ගාළු දිස්ත්‍රික්කේ තල්පේපත්තුව තුල මෙහි පහත සඳහන් ගම්වල පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

සිතියම 10,758. පිහිටි ස්ථානය—පරගොඩ.

| නො. | ඉඩමේ නම. | විස්තර. | මහත. අ. රූ. ප. | අක්කරයකට මුල් අවුරුදු 6යේ එක එක අවුරුද්දට බද්ද රු. | අක්කරයකට ඉතුරු අවුරුදු 24යේ එක එක අවුරුද්දට බද්ද රු. | අක්කරයකට නොහොත් ඉන් කොටසකට මැනීමේ ගාස්තු රු. | අක්කරයක තක්සේරු මිල රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | තැඹිපොල්ගහඅද්දරගොඩ .. | හේන .. | 3 0 23 .. | 1·10 .. | 3·85 .. | 4 .. | 7·50 |
| | සිතියම 10,759. | | | | | | |
| 1 | විහාරේගොඩකන්ද නොහොත් වත්තිආච්චිගේ ගොඩවත්තකන්ද .. | සුළු බැද්ද | 1 0 29 .. | 0·90 . | 3·15 .. | 5 .. | 8 |
| | සිතියම 10,516. පිහිටි ස්ථානය—අගුළුගහ. | | | | | | |
| 3 | කොන්තබෙන්වලගොඩබැද්ද | සුළු බැද්ද | 15 0 25 .. | 1·80 .. | 6·30 .. | 3 .. | 8·50 |

වර්ෂ 1918ක්වූ නොවැබර් මස 7වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්‍ගය.

---

දකුණු පළාතේ මහාඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1918ක්වූ දෙසැම්බර් මස 31වෙනි දිනට හෝ ඊට මත්තෙන් ගාල්ලේ කච්චේරියේදී, පොල්, රබර්, තේ හෝ වෙනත් වැවීම පිණිස මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම් කැබලි වර්ෂ 1919ක්වූ මාර්තු මස 25වෙනි දින පටන් කාලසීමාවක් නොමැතිව බදුගැනීමට ඉල්ලා ලියා එවනලද ඉල්ලුම්පත්‍ර භාරගැනීමට බලාපොරොත්තුව සිටින්නේය. ඉල්ලුම්කරන අයවලුන්ගේ සම්පූර්ණ නම් සහ පදිංචිය සඳහන් නොකල ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද මහාඒජන්ත උන්නාන්සේවෙත අක්කරයකට හෝ ඉන් කොටසකට එක එක බිම්කැබැල්ලට නියමකර තිබෙන ප්‍රකාර මුදලක් තැන්පත්කොට තැබිය යුතුවේ. එසේ මුදලක් තැන්පත් නොකරන්නේනම් එකී ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණන්ට පෙර හෝ ඉඩමේ බද්ද විකිණීම නොකරණවායයි මහාඒජන්ත උන්නාන්සේ විසින් නිශ්චයකරගන්නාතුරු ඉහතකී අන්දමින් තැන්පත්කරණලද මුදල් ආපසු ගෙවනු නොලැබේ. ආණ්ඩුවට අයිති ඉඩම් බදු දෙන ආඥාපණත යටතේ එකී වගන්තිවලට අනුව වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 25වෙනි දිනවූ අඟහරුවාදා දවල් 1ට ගාල්ලේ කච්චේරියේදී බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත. බද්ද වෙන්දේසියේදී ඉල්ලුම්කරන්ට පුළුවන්වන්නේ ඉහතකී ප්‍රකාරයට මුදල් බැඳ ඉල්ලුම්කරපු අයවළුන්ට පමණකි.

බද්දේ කොන්දේසි ආදිය ගාල්ලේ මහාඒජන්ත උන්නාන්සේගෙන් ලබාගන්ට පුළුවන.

දකුණු දිසාවේ ගාළු දිස්ත්‍රික්කේ ගංබඩපත්තුවතුල මෙහි පහත සඳහන් ගම්වල පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

සිතියම 9,710. පිහිටි ස්ථානය—වඳුරඹ.

| නො. | ඉඩමේ නම. | විස්තර. | මහත. අ. රූ. ප. | අක්කරයකට මුල් අවුරුදු 6යේ එක එක අවුරුද්දටබද්ද. රු. | අක්කරයකට ඉතුරු අවුරුදු 24රේ එක එක අවුරුද්දට බද්ද. රු. | අක්කරයකට නොහොත් ඉන් කොටසකට මැනීමේ ගාස්තු. රු. | අක්කරයක තක්සේරු මිල. රු. |
|---|---|---|---|---|---|---|---|
| 3200 | දෙලඅරඹේ සහ මානාගොඩ කන්ද .. .. | බැද්ද .. | 44 0 26 .. | 1·80 .. | 6·30 .. | 3 .. | 8·50 |
| | සිතියම 10,886. පිහිටි ස්ථානය—ඉහලකිඹිය. | | | | | | |
| 1 | කීඹියකන්ද නොහොත් ගමේ කන්ද .. .. | බැද්ද .. | 2 3 32 .. | 0·90 .. | 3·15 .. | 4 .. | 7 |

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 7වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්‍ගය.

---

දකුණු පළාතේ මහාඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 5වෙනි දිනට හෝ ඊට මත්තෙන් ගාල්ලේ කච්චේරියේදී පොල්, රබර්, තේ හෝ වෙනත් වැවීම පිණිස මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම් කැබලි වර්ෂ 1919ක්වූ මාර්තු මස 25වෙනි දින පටන් කාල සීමාවක් නොමැතිව බදුගැනීමට ඉල්ලා ලියා එවනලද ඉල්ලුම්පත්‍ර භාරගැනීමට බලාපොරොත්තුව සිටින්නේය. ඉල්ලුම්කරන අයවලුන්ගේ සම්පූර්ණ නම් සහ පදිංචියද සඳහන් නොකර ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද මහා ඒජන්ත උන්නාන්සේ වෙත අක්කරේකට හෝ ඉන් කොටසකට එක එක බිම්කැබැල්ලට නියමකර තිබෙන ප්‍රකාර මුදලක් තැන්පත්කොට තැබිය යුතුවේ. එසේ මුදල් තැන්පත් නොකරන්නේනම් එකී ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණන්ට පෙර හෝ ඉඩමේ බද්ද විකිණීම නොකරනවායයි මහා ඒජන්ත උන්නාන්සේ විසින් නිශ්චය කරගන්නාතුරු ඉහතකී අන්දමින් තැන්පත්කරනලද මුදල් ආපසු ගෙවනු නොලැබේ. ආණ්ඩුවට අයිති ඉඩම් බදු දෙන ආඥාපණත යටතේ එකී වගන්තිවලට අනුව වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 25වෙනිදිනවූ අඟහරුවාදා දවල් 1ට ගාල්ලේ කච්චේරියේදී බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුනන්ට යෙදෙනවා ඇත. බද්ද වෙන්දේසියේදී ඉල්ලුම්කරන්ට පුලුවන්වන්නේ ඉහතකී ප්‍රකාරයට මුදල් බැඳ ඉල්ලුම්කරපු අයවලුන්ට පමණකි. බද්දේ කොන්දේසි ආදිය ගාල්ලේ මහ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගන්ට පුළුවන.

දකුනු දිසාවේ ගාළු දිස්ත්‍රික්කේ කඩවත්සතරතුල මෙහි පහත සඳහන් ගම්වල පිහිටා තිබෙන බිම්කැබලි 2ක්.

සිතියම 10,948. පිහිටි ස්ථානය —ඉහලගොඩ

| නො. | ඉඩමේ නම. | විස්තර. | මහත. අ. රූ. ප. | අක්කරයකට මුල් අවුරුදු 6යේ එක එක අවුරුද්දට බදු. රු. | අක්කරයකට ඉතුරු අවුරුදු 24රේ එක එක අවුරුද්දට බදු. රු. | අක්කරයකට නොහොත් ඉන් කොටසකට මැනීමේ ගාස්තු. රු. | අක්කරයක තක්සේරු මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | ගල්පොතෙතගොඩකන්ද .. | බැද්ද | 4 1 35 .. | 3·20 .. | 11·20 .. | 4 .. | 14 |
| | සිතියම 10,517. පිහිටි ස්ථානය.—නියාගම. | | | | | | |
| 1 | ගජනායකගොඩ .. | බැද්ද | 2 0 3 .. | 5·20 .. | 18·20 .. | 4 .. | 20 |

වර්ෂ 1918ක්වූ නොවැම්බු මස 7වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වර්‍ගය.

දකුණු පලාතේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1919ක්වූ ජනවාරි මස 31වෙනි දිනට හෝ ඊට මත්තෙන් ගාල්ලේ කච්චේරියේදී පොල්, රබර්, තේ හෝ වෙනත් වැවීම පිණිස මෙහි පහත සඳහන් ආණ්ඩුව සන්තක ඉඩම් කැබෙලි වර්ෂ 1919ක්වූ මාර්තු මස 11වෙනි දින පටන් කාලසීමාවක් නොමැතිව බදු ගැනීමට ඉල්ලා ලියාඑවනලද ඉල්ලුම්පත්‍ර භාරගැනීමට බලාපොරොත්තුව සිටින්නේය. ඉල්ලුම්කරණ අයවලුන්ගෙ සම්පූර්ණ නම් සහ පදිංචියද සඳහන් නොකර ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද මහ ඒජන්ත උන්නාන්සේ වෙත අක්කරයකට හෝ ඉන් කොටසකට එක එක බිම්කැබැල්ලට නියමකර තිබෙන ප්‍රකාර මුදලක් තැන්පත්කොට තැබිය යුතුවේ. එසේ මුදල් තැන්පත් නොකරන්නේනම් එකී ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණන්ට පෙර හෝ ඉඩමේ බද්ද විකිණීම නොකරණවායයි මහ ඒජන්ත උන්නාන්සේ විසින් නිශ්චයකරගන්නාතුරු ඉහතකී අන්දමින් තැන්පත්කරණලද මුදල් ආපසු ගෙවනු නොලැබෙත්. ආණ්ඩුවට අයිති ඉඩම් බදු දෙන ආඥාපණත යටතේ එකී වගන්තිවලට අනුව වර්ෂ 1919ක්වූ පෙබරවාරි මස 11වෙනි දිනවූ අඟහරුවාදා දවල් 10ට ගාල්ලේ කච්චේරියේදී බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙනවා ඇත. බද්ද වෙන්දේසියේදී ඉල්ලුම්කරන්ට පුලුවන්වන්නේ ඉහතකී ප්‍රකාරයට මුදල් බැඳ ඉල්ලුම්කරපු අයවලුන්ට පමණකි.

බද්දේ කොන්දේසි ආදිය ගාල්ලේ මහ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගන්ට පුළුවන.

දකුණු දිසාවේ ගාළු දිස්ත්‍රික්කේ වැල්ලබඩපත්තුවේ මෙහි පහත සඳහන් ගම්වල පිහිටා තිබෙන බිම්කැබලි 9ක්.

| නො. | ඉඩමේ නම. | විස්තර. | මහත. අ. රූ. ප. | අක්කරයකට මුල් අවුරුදු 6යේ එක එක අවුරුද්දට බද්ද රු. | අක්කරයකට ඉතුරු අවුරුදු 24යේ එක එක අවුරුද්දට බද්ද රු. | අක්කරයකට හෝ ඉන් කොටසකට මැනීමේ ගාස්තු රු. | අක්කරයක තක්සේරු මිල රු. |
|---|---|---|---|---|---|---|---|
| | **සිතියම 10,811. පිහිටි ස්ථානය—කහදූව.** | | | | | | |
| 1 | මාරගස්මුල්ලේදෙනිය | දෙනිය | 1 0 35 | 1·00 | 3·50 | 5 | 8 |
| 2 | එම | එම | 0 2 20 | (තහනම් ඉඩම බදුදෙනු නොලැබේ) | | | |
| | **සිතියම 10,823. පිහිටි ස්ථානය—කරන්දෙනිය.** | | | | | | |
| 2 | ගලගොඩකන්ද | බැද්ද | 5 1 36 | 1·40 | 4·90 | 4 | 8·50 |
| | **සිතියම 10,825. පිහිටි ස්ථානය—කහදූව.** | | | | | | |
| 1 | වැල්ලබැදිකන්ද | බැද්ද | 2 2 12 | 1·00 | 3·50 | 4 | 7 |
| | **පිහිටි ස්ථානය—පිනිකහන.** | | | | | | |
| 2 | එම | එම | 0 2 12 | (නොම්මර එකේ බිම්කට්ටියත් සමග බදුදෙනු ලැබේ) | | | |
| | **10,856. පිහිටි ස්ථානය—ගෝනපීනුවල.** | | | | | | |
| 1 | මොරගහ වත්තේ කැලේ නොහොත්එරනවිලඅද්දරකැලේ | බැද්ද | 8 2 39 | 1·60 | 5·60 | 3 | 8 |
| | **සිතියම 10,933. පිහිටි ස්ථානය—බටපොල.** | | | | | | |
| 1 | දික්බැද්දේකැලේ | බැද්ද | 1 0 7 | 1·80 | 6·30 | 5 | 10·50 |
| 2 | එම | එම | 0 0 15 | (තහනම් ඉඩම බදුදෙනු නොලැබේ) | | | |
| | **සිතියම 10,934.** | | | | | | |
| 1 | දික්බැද්ද | එම | 1 3 37 | 2·00 | 7·00 | 5 | 11 |
| 2 | එම | එලිකරපු ඉඩම | 0 0 21 | (තහනම් ඉඩම බදුදෙනු නොලැබේ) | | | |
| 3 | කුකුල්වල්දුව නොහොත් සිව්සි වත්තේකුඹුරඅද්දඹිට | වත්ත | 1 1 0 | 2·00 | 7·00 | 5 | 11 |
| 4 | එම | එම | 3 0 33 | 2·00 | 7·00 | 4 | 10 |

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 8වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්, මහලේකම් වර්ෂ.

---

**No. 1,304, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජනවාරි මස 6වෙනි දිනවූ සඳුදා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ වැල්ලවාය, වෙල්ලස්ස, උඩුකිඳ, යටිකිඳ සහ බුත්තල කොඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි 20ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | **සිතියම 2,003. ගම—වැල්ලවාය පලාතේ වැල්ලවායකෝරලේ සුදුපානාවෙලගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව.** | | | | |
| 1 | රඹුක්කැපිය | කුරුගම කොස්කොලවත්තේ අප්පුහාමි | හේන, බයට ඉතුරුකර තිබේ, විකිණීමට නොවේ | 0 1 36 | —* |
| 2 | එම | එම | හේන | 1 2 1 | 30 |
| 3 | එම | — | හේන, ඇලට ඉතුරකර තිබේ, විකිණීමට නොවේ | 0 0 28 | —* |
| | **අන්තිම සිතියම 166. ගම—වෙල්ලස්ස පලාතේ මැදගම්පත්තුකෝරලේ අලත්මුල්ලගම.** | | | | |
| 46bc | වැවඅරගේ ලන්දේහේන | රජැන්දරු ආචාරීගේ සෙන්දිනයිදේ | හේන | 0 3 17 | 30† |
| | **අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, සෙන්දිනයිදේ විසින් අල්ලාගෙන තිබේ.** | | | | |
| 46bd | වැවඅරගේ ලන්දේහේන | රජැන්දරු ආචාරීගේ සෙන්දි නයිදේ | අවුරුදු 2ක් පමණ වයස්වූ පොල් ගස් 1ද, තෑඹිලිකළ ගෙයක්ද, කෙසෙල් හවලපයක්ද තිබේ | 0 1 9 | 30† |
| | **අයිතිකමකියන්නා—ආණ්ඩුව.** | | | | |
| 46bf | මුතුකෙලියහේන | පිටියේවත්තේ පහල ගෙදර තිසාහාමි | හේන | 0 3 36 | 30† |
| 46bi | එම | පිටියේවත්තේ පහල ගෙදර ගංඇතී | එම | 0 3 38 | 30† |
| 46bk | එම | පිටියේවත්තේ බෝගහවත්තේ ගෙදර බන්ඩා | එම | 1 0 0 | 30† |
| 46bm | එම | ගලහගෙදර අප්පුහාමි | එම | 0 3 20 | 30† |
| 46bp | සියඹලාගහවත්තේහේන | බකිනිගහවෙල පොල්ගහපිටියේ ඉහලගෙදර අප්පුහාමි | එම | 0 2 30 | 30† |

* නොවිකුණ ඉතුරුකරනු ලැබේ. † දෙවෙනි වතාවට ප්‍රසිද්ධකළා ඇත.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, මඩමේවත්තේ අප්පුසිංඤෝ. | | | | |
| 46*bq* | මඩමේවත්ත .. | — | .. අවුරුදු 2ක් පමණ පොල්ගස් 2ක්ද, බුලත් වැලක්ද, දෙඩම් පැලයක්ද, අවුරුදු 1ක් පමණ වයස්වූ පුවක් ගස් තිබේ .. | 0 0 12 | 30† |
| | සිතියම 1,973. ගම—උඩුකිඳ මහපලාතකෝරලේ හපුතලේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 1 | තම්බිරනපතන නොහොත් කබරගලපතන .. | ඩබ්ලිව්. ඇම්. හෝල් මහතා .. | පතන .. | .. 0 2 37 | 50 |
| 4 | එම .. | එම | .. පතන සහ ගල | .. 23 0 22 | 50 |
| 5 | එම .. | එම | .. එම .. | .. 10 2 20 | 50 |
| 9 | තම්බිරනපතන .. | එම | .. එම .. | .. 4 0 22 | 50 |
| | අන්තිම සිතියම 12. ගම—යටිකිඳ රිල්පොලකෝරලේ වැලිවත්තේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, මොරගොල්ලවත්ත විසින් අල්ලාගන තිබේ. | | | | |
| 10*a* | මොරගොල්ලේපතන .. | — | .. රබර් වවා තිබේ | .. 0 1 26 | 400 |
| | අන්තිම සිතියම 29. ගම—යටිකිඳ රිල්පලකෝරලේ කැන්දගොල්ලේගම. අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, සුදුබන්ඩා විසින් අල්ලාගෙන තිබේ. | | | | |
| 35 | ගල්පටියේවත්ත | .. ජී. ආර්. ඇම්. සුදුබන්ඩා | .. අවුරුදු 8 සිට 9 දක්වා වයස්වූ තේ පඳුරු 29ද, කෙසෙල් පඳුරු ස්වල්පයක්ද තිබේ | .. 2 0 12 | 50‡ |
| | අන්තිම සිතියම 78. ගම—බුත්තල පලාතේ බුත්තල වැදිරටකෝරලේ බටුගම්මන. අයිතිකමකියන්නා—ආණ්ඩුව. | | | | |
| 3*t* | මැදඅරුවේහේන | .. ඒ. ඇම්. බී. ගංඇති | .. හේන .. | .. 1 0 4 | 25† |
| | සිතියම 1,105. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ දඹවෙලගම. | | | | |
| 3621 | අම්පිටිතැන්න | .. කදිරිවේල් .. | .. හේන .. | .. 0 0 16 | 45† |
| | අන්තිම සිතියම 60. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරලේ යල්පත්වෙල. අයිතිකමකියන්නා—ආණ්ඩුවේ ඉඩම, විලියම් දුනුවිල දිසාමහත්මයා විසින් අල්ලාගෙන තිබේ. | | | | |
| 4*n* | ඉද්දමත්කඩකුඹුර .. | — | .. කුඹුර .. | .. 0 0 27 | 100† |

† දෙවෙනි වතාවට ප්‍රසිද්ධකළා ඇත.

‡ මීට ප්‍රථමයෙන් මෙම ඉඩම ගැනුම්කාරයා විසින් ගත්ත මුදල නොගෙව් නිසා ප්‍රසිද්ධකළා ඇත.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 7වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,305, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජනවාරි මස 7වෙනි දිනවූ අඟහරුවාද, දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ උඩුකිඳ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

අන්තිම සිතියම 17. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ ඉඩමේගම.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම, | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 22*a2f* | ගොල්ලේකන්දපතන .. | .. ආණ්ඩුව | .. පතන | .. 5 2 23 |

බදු කොන්දේසි.

(*a*) තක්සේරු මුදල් වන රුපියල් 42ක "පිරිමියම්" මෙන් මුදල පිට අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකට වුවත් රුපියල් 3 ගණනේ ඉහත සඳහන්වෙන ඉඩම සදාකාලිකෝට බදු දෙනුලැබේ.

(*b*) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.

(*c*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*d*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පලකරනුලැබේ.

(*e*) තේ වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනුලැබේ.

(*f*) ඉඩම තේ වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(*g*) බදුකාරයා විසින් මෙම ඉඩම් අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*h*) අවුරුදු 30කට වරක් බද්ද අලුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙව්වාවූ බදු මුදලින් බාගයකට වැඩිනොවේ.

(*i*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙණ බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියා දීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 13වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,306, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජනවාරි මස 7වෙනි දිනවූ අඟහරුවාද, දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ උඩුකිඳ කොඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 6ක්.

අන්තිම සිතියම 16. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරලේ හින්නාරන්ගොල්ල.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| G 3 | දුල්ගොල්ලේවකහේන .. | .. ආණ්ඩුව | .. හේන | .. 0 2 20 |
| 23*j* | කිරින්දබැද්දේහෙල නොහොත් දුල්ගොල්ල | .. එම | .. සිහින් කැලෑව | .. 0 3 7 |
| 23*s* | කිරින්දබැද්දේපතන නොහොත් දුල්ගොල්ල | .. එම | .. පතන | .. 5 3 35 |

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 23*t* | එම සහ කොහොලානපතන .. | .. ආණ්ඩුව | .. පතන | .. 5 2 20 |
| 23*u* | එම .. | .. එම | .. එම | .. 15 2 35 |
| 23*v* | එම .. | .. එම | .. එම | .. 19 2 27 |

බදු කොන්දේසි.

(*a*) ඉහත සඳහන්වෙන ඉඩම් සදාකාලිකෙට බදුදෙනු ලැබේ.

(*b*) ඉහත සඳහන්වෙන ඉඩම් එකින් එකට "පිරිමියම්" වන තක්සේරු මුදල් මෙසේය, රුපියල් 7.50, රුපියල් 7.50, රුපියල් 39, රුපියල් 39, රුපියල් 88 සහ රුපියල් 110ක්වේ.

(*c*) අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකට වුවත් බදු මුදල් රුපියල් 2.50ක් වේ.

(*d*) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.

(*e*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*f*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පලකරණු ලැබේ.

(*g*) තේ වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනුලැබේ.

(*h*) ඉඩම් තේ වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(*i*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දු වියයුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*j*) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියාකිරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙව්වාවූ බදු මුදලින් භාගයකට වැඩිනොවේ.

(*k*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙණ බද්ද වෙන කෙනෙකුට පත්කෙරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යම්කට යටත්කෙරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 13වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

No. 1,307, P. of U.—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජනවාරි මස 7වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යොදනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ උඩුකිඳ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 6ක්.

අන්තිම සිතියම 16. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරළේ හින්නාරන්ගොල්ල.

| නො. | ඉඩමේ නම | අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 24*b*2 | ගොල්ලේකන්දේහෙල නොහොත් මහපැලියගොඩ | ආණ්ඩුව | .. පතන | .. 8 2 0 |
| 24*m* | එම .. | .. එම | .. එම | .. 9 3 0 |
| 25 | අස්වැද්දුමේගොඩපතන .. | .. එම | .. එම | .. 32 2 37 |
| 25*f* | එම .. | .. එම | .. එම | .. 26 0 38 |
| 28 | මැදගොඩපතන .. | .. එම | .. එම | .. 6 1 21 |
| 28*f* | එම .. | .. එම | .. එම | .. 5 0 24 |

බදු කොන්දේසි.

(*a*) ඉහත සඳහන්වෙන ඉඩම් සදාකාලිකෙට බදුදෙනු ලැබේ.

(*b*) මෙම ඉඩම් එකින් එකට "පිරිමියම්" වන තක්සේරු මුදල් මෙසේය, රුපියල් 58·50, රුපියල් 65, රුපියල් 181·50, රුපියල් 148·50, රුපියල් 45·50 සහ රුපියල් 39වේ.

(*c*) අවුරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකට වුවත් බදුමුදල රුපියල් 2·50ක්වේ.

(*d*) පළමුවෙනි අවුරුදු හයේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක් වේ.

(*e*) ඒජන්ත උන්නාන්සේගේ අවසර නැතුව ගෙයක් ආදිය ගොඩනැගීම බැරිය.

(*f*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගණලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පලකරණු ලැබේ.

(*g*) තේ වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනුලැබේ.

(*h*) ඉඩම් තේ වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(*i*) බදුකාරයා විසින් මෙම ඉඩම අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද, ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දුවිය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ටනොකළොත් ඉඩමෙන් වවා තිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණු ලැබේ.

(*j*) අවුරුදු 30කට වරක් බද්ද අලුත්වැඩියා කෙරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙව්වාවූ බදු මුදලින් භාගයකට වැඩිනොවේ.

(*k*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පත්කිරීමටවත්, බාර දීමට හෝ ලියාදීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත්යම්කට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 13වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

No. 1,308, P. of U.—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි සහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ ඉඩම් බදුදීමේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1919ක්වූ ජනවාරි මස 7වෙනි දිනවූ අඟහරුවාදා දවල් 12ට බදුළු කච්චේරියේදී බද්ද වෙන්දේසිකර විකුණන්ට යොදනවා ඇත. ඌව දිසාවේ බදුළු දිස්ත්‍රික්කේ උඩුකිඳ කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 8ක්.

අන්තිම සිතියම 17. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරළේ ඉඹිමෙගම.

| නො. | ඉඩමේ නම. | අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | අඹුතුගහඋල්පොත පතන නොහොත් මැදගොඩ පතන .. | ආණ්ඩුව .. | .. පතන | .. 1 1 12 |
| 2*c* | එම .. .. .. | එම .. | .. හේන | .. 0 2 15 |
| 16*t*12 | දරානඑළුවේගොඩපතන නොහොත් බෝගහගහලපතන .. | එම .. | .. පතන | .. 4 3 31 |
| 16*t*16 | එම නොහොත් මැදගොඩ පතන .. .. | එම .. | .. එම | .. 17 0 34 |
| 16*t*21 | එම .. .. .. | එම .. | .. එම | .. 12 1 21 |
| 16*t*24 | දරනැළුවේගොඩපතන නොහොත් බෝගහහෙලපතන .. | එම .. | .. එම | .. 48 1 12 |
| 16*t*25 | එම .. .. .. | එම .. | .. එම | .. 39 0 9 |
| 36 | වෙලන්මහහේන .. .. .. | එම .. | .. එම | .. 0 1 3 |

බදු කොන්දේසි.

(*a*) ඉහත සඳහන්වෙන ඉඩම් සදාකාලිකන්ට බදුදෙනු ලැබේ.

(*b*) ඉහත සඳහන්වෙනඉඩම් එකින් එකට "ප්‍රිමියම්" වශයෙන් තක්සේරු මුදල් මෙසේය, රු. 15, රු. 7·50. රු. 32·50, රු. 99, රු. 71·50, රු. 269·50, රු. 220 සහ රු. 7·50 ක් වේ.

(*c*) අදරුද්දකට අක්කරයකට හෝ එයින් කොටසකටවුවත් බදුමුදල රුපියල් 2·50ක්වේ.

(*d*) පළමුවෙනි අවුරුදු භාගේ අවුරුදු බදු මුදල් මුල් ගණනෙන් තුනෙන් කොටසක්වේ.

(*e*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගෙයක් ආදිය ගොඩනැගිම් නැතිය.

(*f*) ඒජන්ත උන්නාන්සේගේ අවසරය නැතුව ගොඩනගනලද ගෙයක් හෝ ගෙවල් රජසන්තකය කියා පළකරණු ලැබේ.

(*g*) ගස් වැවීමට උවමනාකරණ ගොඩනැගිලි සෑදීමට පමණක් අවසර දෙනුලැබේ.

(*h*) ඉඩම් ගස් වැවීමට පමණක් පාවිච්චිකළ යුතුයි.

(*i*) බදුකාරයා විසින් මෙම ඉඩම් අවුරුදු 5ක් ඇතුළතදී සෑම අවුරුද්දේම 1/10 පංගුවක් වැවීමටද ඉතුරු ඉඩම තවත් අවුරුදු 5ක් ඇතුළත වැවීමට පොරොන්දු විය යුතුයි. මෙම පොරොන්දු ඉෂ්ඨනොකළොත් ඉඩමෙන් වවාතිබෙන කොටස හැර ඉතුරු ඉඩමට බද්දෙන් දෙගුණයක් අයකරණුලැබේ.

(*j*) අවුරුදු 30කට වරක් බද්ද අළුත්වැඩියා කිරීමට හේතුවේ. ප්‍රථම අවුරුදු 30ට ගෙව්වාවූ බදු මුදලින් බාගයකට වැඩිනොවේ.

(*k*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලියමනකින් නොගෙන බද්ද වෙන කෙනෙකුටපත්කිරීමටවත්, බාරදීමට හෝ ලියා දීමටවත් ඒ සියල්ල හෝ එයින් කොටසක්වත් යමකට යටත්කිරීමටවත් බදුකාරයාට බලයක් නැත.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඌව දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වෙයර් ජනරල් තුමාගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 13වෙනි දින කොළඹ
මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඊ. ස්ටබ්ස්,
මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1911ගේ නොම්මර 10 දරණ ආඥාපණතේ 3වෙනි වගන්තියෙන් වෙනස්කරන්ට යෙදුන වර්ෂ 1876ගේ නොම්මර 3 දරණ ආඥාපණතේ නියමවූ පංගාඩම් ප්‍රකාර නොම්මර 16,434 දරණ මුල් සිතියමේ 7වෙනි කොටස වශයෙන් විස්තරකර තිබෙන බස්නාහිර පලාතේ නාගරික සීමාවතුළ කොල්ලුපිටියේ පිහිටි මෙහි පහත දක්වන ඉඩම් කොටස ප්‍රසිද්ධ කටයුත්තක් පිණිස එනම් "T" පලාතේ වැහිවතුර කානුවක් සාදන පිණිස ලබාගන්න මෙන් ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගෙන් මට නියිප්‍රකාර අණලැබී තිබේ, එම ඉඩම් කොටසනම් :—

| නො. | ඉඩමේ නම. | විස්තර. | අයිතිකම්කියන්නා. | විශාලකම, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 7 | වරිපනම් නොම්මර 18*a* දරණ ඉඩමෙන් කොටසක් .. | හිස්ඉඩම | පොල්වත්තේ සෙන්ට් මයිකල් දේවස්ථානයේ ට්‍රස්ටිවරු .. | .. 0 0 12·84 |

එබැවින් 7වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන ප්‍රකාර ආණ්ඩුව විසින් එම ඉඩම් කොටස ලබාගන්ට අදහස්කර සිටින බව පොදුජනයාට ප්‍රසිද්ධ වශයෙන් මෙයින් දැනුම්දෙනු ලැබේ.

ඉහතකී ඉඩම් කොටසට අයිතිවාසිකම් ඇත්තාවූ සියලුදෙනම තමුන්ට නොහොත් තමුන් වෙනුවෙන් ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ දෙසැම්බර් මස 16වෙනි සඳුදින පස්වරු 1ට කොළඹ නාගරික සභා කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ මොන අන්දමේ අයිතිවාසිකම්ද යනු කියා සිටින්ට ඕනෑවා සහ මෙ ඉඩම් කොටස වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 12වෙනි දින
කොළඹ නාගරික සභාකන්තෝරුවේදීය.

ආර්. ඩබ්ලිව්. බර්ඩ්,
නාගරික සභාවේ සභාපතිතුමා සහ කොළඹ නගරාධිපතිතුමා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම් :—කොඩිකාමම් මාර්කට් එක විශාලකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රී සභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම් :—

සිතියම 4,175. ගම—කොඩිකාමම්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| M 18 | කට්ටෙපරිත්තාන් .. | පොල් වත්ත .. | කනපදියාර්ගේ වැන්දඹු සින්නාච්චි සහ ලදරුවෝ, පොන්නයියා නඩරාජා සහ පොන්නයියා වේළුප්පුල්ලේ නොහොත් කනපදිප්පුල්ලේ .. .. | .. 0 0 20·62 |
| N 18 | එම .. | එම .. | කාත්තිකේසර් සිදම්බරප් පුල්ලේ .. | .. 0 0 17·37 |
| O 18 | එම .. | එම .. | කාත්තිකේසර් ජනම්බලවානර් .. | .. 0 0 6·75 |
| P 18 | එම .. | පොල් සහ තල්ගස් .. | කන්දසියර්, වේළුප් පුල්ලේ, මුරුගේසර් කදිර්ගාමර් සහ කාත්තිකේසර් කන්දසියර් .. | .. 0 1 4·25 |
| Q 18 | එම .. | සියඹලා ගහක් සහ ස්වල්ප මඩු .. | කන්දසියර් වේළුප්පුල්ලේ .. | .. 0 0 16·37 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1918ක්වූ දෙසැම්බර් මස 3වෙනි දින දවල් එකේ කානිසමට යාපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1918ක්වූ නොවැම්බර් මස 4වෙනි
දින යාපනේ කච්චේරියේදීය.

බී. හෝර්ස්බොරෝ,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම් :—තින්දවූර්හි ආණ්ඩුවේ දෙමළ පාඨශාලාවක් විවෘතකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම් :—

සිතියමේ නො. 5,338. ගම—තින්දවූර්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත. අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පල්ලිවළවූ .. | පාඨශාලා ගොඩනැගිල්ලක් ඇති පොල්වත්ත .. | කල්මුනේ රෝමානු කතෝලික සභාව | .. 0 2 34·1 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1918ක්වූ දෙසැම්බර් මස 10වෙනි දින පස්වරු 1.30ගේ කායිසමට මඩකලපු කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 6වෙනි
දින මඩකලපු කච්චේරියේදීය.

ආර්. ඒ. ජී. පැස්ටිං,
නැ. දි. ආණ්ඩුවේ ඒජන්ත වම්ෂ.

---

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[හම්බන්තොට දැන්වීම නො. 7,050.]

වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 15වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිවාසිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900යේ සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඒ. ඇල්. ක්‍රොස්මන් උන්නාන්සේගේ ඉදිරිපිට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබී තිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සැම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරන බව මෙයින් දැනගත යුතුයි.

ඒ. ඇල්. ක්‍රොස්මන්,
ඉඩම්වල තොරතුරු. විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ මෝදරවාන යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියම්වල* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

I.—මූල් සිතියම 264

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 64 | පැලවත්ත | 0 1 35 |

මීට මායිම්—උතුරට රනසිංහ ආරච්චිගේ බබුනේ සහ තවත් කෙනෙක් විසින් අයිතිකම්කියන පැලවත්තද; නැගෙනහිරට රජසන්තක විදානේකන්කානන්ගේ වත්තද; දකුණට 271,519 සහ 267,261 පිඹුරුකබඩාසිවල පේන ඉඩම්ද; බස්නාහිරට ආණ්ඩුව විසින් විකුනාපු පාර්වත්තේහේනද (301,361 පිඹුරුකබඩාසියේ පේන ඉඩම.)

II.—මූල් සිතියම 264.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 159B | කිරමගේමහවත්ත | 1 0 31 |

මීට මායිම්—උතුරට අහන්ගමලියනගේ දෙන් අන්ද්‍රිස් සහ තවත් අය විසින් අයිතිකම්කියන අඹුපිට්ටනියද; නැගෙනහිරට පිහිදියගේ දියෝනිස් විසින් අයිතිකම්කියන මැදරුප්පේවත්තද; දකුණට 266,874 පිඹුරුකබඩාසියේ පේන ඉඩමද, ආණ්ඩුව විසින් විකුනාපු මාරගහහේනද (313.012 පිඹුරුකබඩාසියේ පේන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපු මාරගහහේනද (313,461 පිඹුරුකබඩාසියේ පේන ඉඩම), ආණ්ඩුව විසින් විකුනාපු මාරගහහේනද (313,484 පිඹුරුකබඩාසියේ පේන ඉඩම); බස්නාහිරට රජසන්තක යොන්දෙහිගහහේනද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 2141—2142වෙනි පිටුවල ප්ලෑන් බලනු.

[හම්බන්තොට වි. ම. 16—1918.]

---

[හම්බන්තොට දැන්වීම නො. 7,051.]

වර්‍ෂ 1918ක්වූ නොවැම්බර් මස 15වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළතදී මෙහි පහත දක්වන ඉඩම්වලට නොහොත් ඉන් එකකට නොහොත් වැඩිගණනකට යම් අයිතිකමක් තිබෙන යම් අයවල් ඇත්නම් ඒ අයවලුන් විසින් මුඩුබිම් සම්බන්ධව වර්‍ෂ 1897, 1899, 1900 සහ 1903යේ ආඥාපණත්වල 28වෙනි වගන්තියේ ප්‍රකාරයට පත්කරනුලැබූ විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේගේ කොළඹ කන්තෝරුවේදී ඒ. ඇල්. ක්‍රොස්මන් උන්නාන්සේගේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට හෝ ලියවිල්ලකින් එකී ඉඩම්වලට නොහොත් ඊට ඇති යම් කොටසකට කිසි අයිතිවාසිකමක් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේට ඉහතකී ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් එක්කෝ එයින් අයිතිවාසිකමක් ගෙනහැර දක්වන්ට නොයෙදුන සැම ඉඩම් රජසන්තක ඉඩම් හැටියට උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් උන්නාන්සේ විසින් ප්‍රකාශකරණ බව මෙයින් දැනගත යුතුයි.

ඒ. ඇල්. ක්‍රොස්මන්,
ඉඩම්වල තොරතුරු. විශෙෂ මන්ත්‍රීශ්වරයානන්නාන්සේ.

දකුණු දිසාවේ හම්බන්තොට දිස්ත්‍රික්කේ බස්නාහිර ගිරුවාපත්තුවේ පල්ලේවාවුව යන ගම පිහිටා තිබෙන මීට අමුනාපු සිතියමේ* පෙනියන මෙහි පහත දක්වන බිම්කට්ටි, එනම්:—

මූල් සිතියම 269.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 7 | ගොඩඇළ (ඇළ) | 0 3 26 |
| 8 | දියපාර | 0 3 1 |
| 9 | කිරමඅර (දියපාර) | 1 0 0 |
| | | 2 2 27 |

මීට මායිම්—උතුරට උඩවාවුව යන ගමේ ගම්ඉමද, මැදවාවුව යන ගමේ ගම්ඉමද, කදුරුලියද්ද යන ගමේ ගම්ඉමද; නැගෙනහිරට කදුරුලියද්ද යන ගමේ ගම්ඉමද; දකුණට හීනටි හත්අමුන යන ගමේ ගම්ඉමද, කකුළුවාමුල්ල යන ගමේ ගම්ඉමද; බස්නාහිරට යටිගල යන ගමේ ගම්ඉමද, උඩවාවුව යන ගමේ ගම්ඉමද.

